**විසර්ජන ශීර්ෂය 117 - වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව 2012 වර්ෂය**

## 1.1 විගණන විෂය පථය

වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් ප්‍රකාශ අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහාවූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝම්බර් 22 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන්ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය මෙහි (අ) සහ (ආ) හි වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

## (අ) විසර්ජන ගිණුම

### (i) මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.147,963,330,000 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු.146,878,010,734 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු. 1,085,319,266 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.73 ක ප්‍රමාණයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 200,300,000 | 197,641,045 | 1,662,666 | 0.84 |
| මූලධන | 144,367,230,000 | 147,765,688,955 | 1,083,656,600 | 0.73 |
| එකතුව | 144,567,530,000 | 147,963,330,000 | 1,085,319,266 | |

### (ii) අයවැය විචලනය

- වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.35,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.
- වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එකතුව රු. 97,061,798 ක් වූ අතර එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 ත් සියයට 75 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

විෂය අංක 11701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 5,000,000 | 4,978,234 | 3,900,000 | 6,264,664 | 27,000,000 | 24,855,832 |

විෂය අංක 11701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් දිනට 31 සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,694,562 ක් වූ අතර එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 1.4 යහ පාලනය හා ගිණුම්කටයුතුභාවය

### වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2011 දෙසැම්බර් දින 31 වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

### (අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය 2013 මාර්තු 15 දිනට ප්‍රථම සිදුකර එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තා 2013 ඔක්තෝම්බර් 15 දින ඉදිරිපත් කර තිබුණි.

### (ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

මාර්ග සංවර්ධන අධිකාරියට අයත්ව තිබූ වාහන 10 ක් අමාත්‍යාංශයේ භාවිතයට ගෙන තිබුණි.

## 1.6 අනුකූල නොවීම්

### (අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 104 | - | අමාත්‍යාංශයේ වාහන 03 කට සිදුවූ හදිසි අනතුරුවලට අදාල මූලික වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ii) භාණ්ඩාගාර චක්‍රලේඛ** | | |
| දිනැති අංක 19 දෙසැම්බර් 1978 ලේඛයදරන චක්‍ර 842 | - | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| **(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | |
| මාර්ගෝපදේශය 4.1 | 1,478,989 | කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 ක උපරිමයකට යටත්ව වැඩපූර්ව අත්තිකාරම් (mobilization advance) ගෙවිය හැකි වුවත්, ඊට පටහැනිව රු.2,957,977 ක අගයකට පිරිනමන ලද කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 50 කට සමාන වැඩපූර්ව අත්තිකාරම් ගෙවා තිබුණි. |

## 1.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

### (අ) ව්‍යාපෘති අත්හැර දැමීම

කොළඹ - නුවර විකල්ප අධිවේගී මාර්ගය ව්‍යාපෘතියේ පියවර I යටතේ කිලෝමීටර් 48.2 ක මාර්ග පහසුකම් සැකසීමේ මූලික කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක කර තිබූ අතර ඒ සඳහා රු. මිලියන 284 ක් වැය කර තිබුණි. යෝජිත මාර්ගයේ මූලික සැලසුම් අවසන් කර අනුමත නොකර තිබීමේ හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ කටයුතු 2012 දෙසැම්බර් 31 දින සිට අතරමඟ නවතා තිබුණු අතර, දැනට සැලසුම් කරමින් පවතින උතුරු අධිවේගී මාර්ගයට සම්බන්ධිත මාර්ගයක් ලෙසින් මෙම මාර්ගය නව සැලැස්මක් යටතේ ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

**(ආ) <u>මහනැඟුම ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය 2012 වර්ෂය</u>**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** මහනැඟුම වැඩසටහනට අනුව වර්ෂ කිහිපයක් තුළ එක මාර්ගයක පියවරෙන් පියවරට සංවර්ධනයට යොමුකිරීම සිදුවන අතර එකම මාර්ගයේ සමහර කොටස් වෙනත් ව්‍යාපෘතිවල ආධාරයෙන් (ගම නැඟුම, සභා අරමුදල්) සංවර්ධනය කිරීම් සිදුකර තිබුණි. ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී සංවර්ධනය සිදුකිරීමට අපේක්ෂිත මාර්ග කොටස නිශ්චිතව හඳුනාගත හැකිවන ආකාරයට අවශ්‍ය විස්තර ඇස්තමේන්තුවට ඇතුළත් කර නොතිබුණු අවස්ථා 5 ක් භෞතිකව කරන ලද මාර්ග පරීක්ෂාවේදී අනාවරණය විය.

**(ii)** ප්‍රාදේශීය සභාවලට අත්පත් කර නොගත් මාර්ග ද මහනැඟුම වැඩසටහන යටතේ ලබාගත් ප්‍රතිපාදන මඟින් කොන්ක්‍රීට් කුට්ටිගල් අතුරා සංවර්ධනය කර තිබුණි. සංවර්ධනය කිරීමෙන් පසුද එම මාර්ග ප්‍රාදේශීය සභාවලට පවරා නොගැනීමේ හේතුවෙන් ඒවායේ නඩත්තු කටයුතු සිදුකර නොතිබුණි.

**(iii)** මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ ග්‍රාමීය මාර්ග කොන්ක්‍රීට් කුට්ටිගල් අතුරා සංවර්ධනය කිරීම වුවත්, මාර්ග තලයන් සකස් නොකොට පැතිබැම්, කානු, බෝක්කු හා කුඩා පාලම් වැනි නිර්මිත (Structures) පමණක් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපාදන සලසා තිබූ ව්‍යාපෘති 22 ක් විය. මෙවැනි මාර්ගතලය (Surface) සංවර්ධනය නොවීම තුළින් මෙම ව්‍යාපෘතියේ අරමුණු සම්පූර්ණවී නොතිබුණි.

**(iv)** ග්‍රාමීය මාර්ගවල නිර්මිත (Structures) සකස් කිරීම සඳහා තාක්ෂණික දැනුමකින් සමන්විත පිරිසකගේ සේවය අවශ්‍ය වන අතර ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තු සඳහා යොදාගනු ලබන ගොවි සමිති හා අනෙකුත් ප්‍රජා සංවිධානවලට එම තාක්ෂණික දැනුම නොමැතිව, ඉදිකරනු ලබන නිර්මිතවල (Structures) උසස් ගුණාත්මක තත්ත්වයක් අපේක්ෂා කල නොහැකි අතර පළාත් පාලන ආයතනවල තාක්ෂණික නිළධාරීන්ගේ සේවය ඉහත ව්‍යාපෘතිවලට අදාල කරගෙන තිබුණත්, ඔවුන්ගේ සේවාවන්වල ප්‍රමාණවත්භාවය පරීක්ෂා කිරීමට හැකිවන සේ අදාල විස්තර හා වාර්තා රැස්කර නොතිබුණි. භෞතික පරීක්ෂාවන්හිදී නිර්මිත ඉදිකිරීම් කටයුතුවල නිරතවූ ගොවි සමිති හා අනෙකුත් ප්‍රජා සංවිධාන 03 ක් පැවතුණි.

## 1.8 කාර්යසාධනය

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකල කාර්යයන්

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් අතර දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ පින්නදූව සිට මාතර දක්වා වූ කොටසෙහි ඉදිකිරීම්වල සැලකිය යුතු ප්‍රමාදයන් විය. කොන්ත්‍රාත්තු 2 ක 2012 දෙසැම්බර් 31 දිනට පින්නදූව - කෝදාගොඩ කොටසේ හා කෝදාගොඩ - ගොඩගම කොටසේ සියයට 47.7 ක් හා සියයට 48 ක ප්‍රගතියක් අපේක්ෂා කර තිබුණත් එම කොටස්වල භෞතික ප්‍රගතිය සියයට 26 ක් හා සියයට 38 ක් වූ බව නිරීක්ෂණය විය.

### (ආ) සැලසුම් කිරීම

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු නොකිරීම**

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කර නොතිබුණු බව වාර්ෂික ප්‍රගති වාර්තාවන් පරීක්ෂා කිරීමේදී හෙළිදරව් විය.

**මහා මාර්ග අංශය**

**(i) මඩකලපුව කලපුව හරහා මන්මුනෙයි පාලම ඉදිකිරීම**

2012 ජූනි මාසයේදී ආරම්භ කරන ලද මෙම ව්‍යාපෘතිය 2014 මැයි මස නිම කිරීමට අපේක්ෂිත විය. සමාලෝචිත වර්ෂය තුල සලසා තිබුණු රු. ලක්ෂ 57 කින් රු. ලක්ෂ 7 ක් පමණක් උපයෝජනය කර තිබුණි. මේ පිළිබඳව ලේකම්වරයාගේ පිළිතුරට අනුව භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමේ හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකල බව දක්වා තිබුණි.

**(ii) පිටත වටරවුම් මහා මාර්ගය**

**II අදියර - කඩුවෙල සිට කඩවත දක්වා කොටස**

කඩුවෙල සිට කඩවත දක්වා කිලෝමීටර් 8.9 ක් දිගැති මංතීරු හතරේ අධිවේගී මාර්ගය ඉදිකිරීම සහ කඩුවෙල හා කඩවත අන්තර් හුවමාරු ස්ථාන ඉදිකිරීම මේ යටතේ සැලසුම් කර තිබුණි. 2011 නොවැම්බර් මස කොන්ත්‍රාත්තුව රු. බිලියන 44.88 කට ප්‍රදානය කරන ලදී. සමාලෝචිත වර්ෂය අවසානයට අත්පත් කරගැනීමට අපේක්ෂිතවූ ඉලක්කය සියයට 13.1 ක් වුවත්, 2012 දෙසැම්බර් 31 දිනට සමස්ථ භෞතික ප්‍රගතිය සියයට 8 ක් විය.

**(iii) <u>ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය</u>**

මෙම ව්‍යාපෘතිය යටතේ වූ අදාල මාර්ගවල ඉදිකිරීම් කටයුතු නිමවී තිබුණි. මේ යටතේ ඉදිකිරීම් කටයුතු සිදුකරන මහා මාර්ග මහලේකම් කාර්යාලය 2011 වර්ෂයේදී නිමකිරීමට අපේක්ෂිත විය. රු. මිලියන 959 ක් වැය කර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අත්කරගෙන තිබුණු ප්‍රගතිය සියයට 82 ක් වූ අතර මේ නිසා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එහි කාර්යාල කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි.

**(iv) <u>ජාතික මහා මාර්ග ආංශික ව්‍යාපෘතිය (අතිරේක ණය)</u>**

මාර්ග කොටස් 7 ක පුනරුත්ථාපන කටයුතු ඉටුකිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ විය. කටුකුරුන්ද - නාගොඩ මාර්ග කොටසෙහි කිලෝමීටර් 2.72 ක් පුනරුත්ථාපන කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 308 කට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එහි වැඩ කටයුතු 2012 මැයි මාසයේදී ආරම්භ කල අතර සමාලෝචිත වර්ෂය තුල අපේක්ෂිත භෞතික ප්‍රගතිය සියයට 45 ක් වුවත්, ඉටුකරගෙන තිබුණු භෞතික ප්‍රගතිය සියයට 26 ක් විය. සෙසු මාර්ග කොටස් 6 හි කිලෝමීටර් 59.17 ක පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර නොතිබුණි. එම මාර්ග කොටස්වල වර්ෂය අවසානයට අපේක්ෂා කල භෞතික ප්‍රගතිය පහත පරිදි විය.

| <u>කාර්යයන්</u> | <u>භෞතික ඉලක්ක</u> |
|---|---|
| | % |
| නිර්මිත සැදීම | 10 |
| පාදම සකස් කිරීම | 05 |

**(v) <u>බේස්ලයින් මාර්ගය - අදියර III</u>**

2011 වර්ෂයේදී ඉඩම් අත්පත් කරගැනීමේ කටයුතු ආරම්භ කර තිබූ අතර 2012 වර්ෂය අවසාන වනවිට අත්පත් කරගැනීමේ ක්‍රියාවලියෙන් සියයට 85 ක් නිමකිරීමට අපේක්ෂා කර තිබුණ නමුත්, තථ්‍ය ප්‍රගතිය සියයට 15 ක් විය. මේ සම්බන්ධයෙන් ලේකම්වරයාගේ පිළිතුර අනුව 2012 වර්ෂය තුල රු.මිලියන 50 ක් ප්‍රතිපාදන සලසා තිබූ නමුත් භාණ්ඩාගාරය විසින් මෙම වර්ෂය තුල අක් මුදල් නිදහස් නොකිරීම හේතුවෙන් අදාල වන්දි මුදල් ගෙවීමට නොහැකිවී තිබුණි.

**(vi) <u>බදුල්ල මහනුවර විකල්ප මාර්ගය (රජ මාවත)</u>**

2012 වර්ෂය අවසාන වන විට කි.මී.4.2 ක් වූ මෙම මාර්ගය ඉදිකිරීම් කටයුතු නිමකිරීමට ඉලක්ක කර තිබුණද 2012 දෙසැම්බර් මස වන විට පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාව ලබාගැනීමට පමණක් කටයුතු කර තිබුණි.

**(vii) <u>ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - I</u>**

මේ යටතේ සංවර්ධනය කරනු ලබන මාර්ග අතුරින් පහත දැක්වෙන මාර්ගවල ඉලක්ක කර තිබූ ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් සියයට 81 ක් හා සියයට 80 ක් වූ අතර ඒවායේ භෞතික ප්‍රගතිය පහළ මට්ටමක පැවතිණි.

**(අ)** පැලවත්ත - කන්කොටියාවත්ත - මොරවක මාර්ගය - සියයට 45

**(ආ)** තිරුවානාකැටිය - අගලවත්ත මාර්ගය - සියයට 40

**(viii) <u>ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය - II</u>**

මෙම ව්‍යාපෘතිය යටතේ රු.මිලියන 61,038 ක අගයකින් යුතු සිවිල් වැඩ කොන්ත්‍රාත්තු 25 ක් ප්‍රදානය කර තිබුණු අතර නව ගුවන් පාලම් දෙකක් ඉදිකිරීම සහ මාර්ග දෙකක පාලම් නැවත ඉදිකිරීම සහ පුළුල්කිරීමද මෙම වැඩසටහනට අයත් විය. වර්ෂය අවසාන වන විට අපේක්ෂිත කාර්යසාධන මට්ටමට ළඟානොවූ ව්‍යාපෘති 15 ක් නිරීක්ෂණය විය. එම එක් එක් ව්‍යාපෘතිය ළඟා කර ගත් භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| <u>ව්‍යාපෘති විස්තරය</u> | <u>අපේක්ෂා කල කාර්යසාධන මට්ටම</u><br>% | <u>භෞතික ප්‍රගතිය</u><br>% |
|---|---|---|
| *හොරවල - පැලවත්ත - පිටිගල මාර්ගය | 39 | 26 |
| *හොරණ - අඟුරුවාතොට - අළුත්ගම මාර්ගය | 56 | 20 |
| *තිරුවානකැටිය - අගලවත්ත මාර්ගය | 55 | 15 |
| * හොරවල පිටිගල මාර්ගය - පැලවත්ත - | 100 | 28 |
| *කඩහපොල - රඹාවැව මාර්ගය | 16 | 14 |
| *කුරුණෑගල - නාරම්මල - මාදම්පේ මාර්ගය | 15 | 13 |
| *ගලගෙදර - රඹුක්කන මාර්ගය | 09 | 08 |
| *පාලවිය - කල්පිටිය මාර්ගය | 45 | 16 |

| | | |
|---|---|---|
| *මහියංගනය - දිඹුලාගල - දළුක්කනේ මාර්ගය | 40 | 05 |
| *මනම්පිටිය - අරලගන්විල - මාදුරුඔය මාර්ගය | 06 | 05 |
| *හුංගම - මිද්දෙණිය මාර්ගය | 24 | 13 |
| *තැන්නේකුඹුර - රිකිල්ලගස්කඩ - රාගල මාර්ගය | 18 | 17 |
| *තිහගොඩ -කඹුරුපිටිය - මාවරල - කොටපොල මාර්ගය | 14 | 06 |
| *නුවරඑළිය දිස්ත්‍රික්කයේ පළාත් මාර්ග 13 ක් | 28 | 25 |
| *නාගොඩ - කලවැල්ලාව - බැල්ලපිටිය මාර්ගය | 27 | 16 |

මෙම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු. මිලියන 29,325.5 ක් වැය කර තිබුණි.

<u>වරාය අංශය</u>

**(i)** **<u>ඔලුවිල් වරාය සංවර්ධනය අදියර II</u>**

ව්‍යාපෘතියේ කටයුතු 2008 ජූලි 01 දින ආරම්භ කරන ලද අතර ඇස්තමේන්තුගත වියදම රු. මිලියන 7,790 ක් විය. 2010 සැප්තැම්බර් 30 දින වනවිට නිමකිරීමට අපේක්ෂිත වූ නමුත් ව්‍යාපෘතිය 2012 දෙසැම්බර් මාසයේදී නිමකර තිබුණි. මේ අනුව මාස 27 ක කාලයක ප්‍රමාදයක් ඇතිවී තිබූ අතර මෙම ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.මිලියන 6,592.8 ක වියදමක් කර තිබුණි.

**(ii)** **<u>මාගම් රුහුණුපුර මහින්ද රාජපක්ෂ වරාය (අදියර II)</u>**

2011 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘතිය 2011 වර්ෂය අවසානයේදී නිමකිරීමට ඉලක්ක කර තිබුණි. ව්‍යාපෘතියේ මූලික සැලැස්මට අනුව II අදියර සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 808 ක ණය මුදලක් අනුමතවී තිබුණු අතර, 2012 වර්ෂයේදී කොන්ත්‍රාත්තුවේ කටයුතු ආරම්භ කර 2015 වර්ෂය අවසන් වනවිට නිමකිරීමට අපේක්ෂිතය.

**1.9** **<u>අවිධිමත් ගණුදෙනු</u>**

දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ අමාත්‍යාංශයේ ප්‍රදර්ශනකුටිය ඉදිකිරීමේ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.2,957,977 ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** අමාත්‍යාංශය වෙත ප්‍රදර්ශනය සඳහා වෙන්කරන ලද භූමි ප්‍රමාණය නිශ්චිතව තහවුරු කර නොගෙන තාක්ෂණ ඇගැයීම් කමිටුව විසින් රු.2,957,977 ක ලංසුව නිර්දේශ කර තිබුණි.

**(ii)** රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(1) මාර්ගෝපදේශය ප්‍රකාරව ගෙවිය හැකි වැඩපූර්ව අත්තිකාරම් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 20 සීමාවුවත්, එම සීමාව නොසලකා සියයට 50 කට සමාන වැඩපූර්ව අත්තිකාරම් ගෙවා තිබුණි.

**1.10** පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** නියෝජ්‍ය ඇමතිවරයාගේ නිල නිවසේ ජල බිල්පත් නියමිත කාලය තුල නිරවුල් නොකිරීම හේතුවෙන් රු.5,415 ක ප්‍රමාද ගාස්තු සමාලෝචිත වර්ෂය තුලදී ගෙවීමට සිදුවී තිබුණි.

**(ආ)** අමාත්‍යාංශය සතු, භාවිතා නොකරන ලද දුරකථන 2 ක් වෙනුවෙන් බදු මුදල් වශයෙන් රු.17,810 ක් සමාලෝචිත වර්ෂය තුලදී දුරකථන සමාගමකට ගෙවා තිබුණි.

**1.11** අනාර්ථික ගනුදෙනු

මහනැගුම ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කොන්ක්‍රීට් කුට්ටිගල් නිෂ්පාදනය සඳහා යන්ත්‍ර මිලදී ගැනීමට රු.මිලියන 57 ක්, 2010 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරියට ලබාදී තිබුණත් ඉන් රු.මිලියන 10.8 ක මුදලක් පමණක් ආපසු අයකරගෙන තිබුණි. මෙම ප්‍රතිපාදන වැයකර මිලදීගත් කොන්ක්‍රීට් ගල් නිෂ්පාදනය යන්ත්‍ර 54 න් යන්ත්‍ර 21 ක් භාවිතයෙන් ඉවත් කර තිබුණත් ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103(1) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**1.12** මානව සම්පත් කළමනාකරණය

**(අ)** මහා මාර්ග අංශය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 24 | 18 | 06 | - |
| **(ii)** | තෘතියික මට්ටම | 04 | 03 | 01 | - |
| **(iii)** | ද්විතියික මට්ටම | 573 | 39 | 534 | - |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 34 | 26 | 08 | - |
| **(v)** | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 03 | - | 03 |
| | එකතුව | 635 | 89 | 549 | 03 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i)** අමාත්‍යාංශයේ වාහන කළමනාකරණයේ වගකීම දැරීම සඳහා ප්‍රවාහන නිළධාරී තනතුරක් අනුමත කාර්යය මණ්ඩලය තුල පවතින අතර එම තනතුර 2011 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවතුණි.

**(ii)** මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කාර්යය මණ්ඩලයෙන් 66 දෙනෙකු අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා යොදවාගෙන තිබුණි.

**(iii)** සමාලෝචිත වර්ෂය අවසාන වනවිට බඳවාගැනීම් සිදුනොකරන ලද මුළු සේවක පුරප්පාඩු සංඛ්‍යාව 549 ක් විය.

<u>වරාය අංශය</u>

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 09 | 11 |
| **(ii)** | තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| **(iii)** | ද්විතියික මට්ටම | 65 | 39 | 26 |
| **(iv)** | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 36 | 21 | 15 |
| | එකතුව | 125 | 70 | 55 |

පුරප්පාඩු 55 ක් බඳවාගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.